**ණය මණ්ඩලය - 2017**

**------------------------------**

ණය මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනතින් සංශෝධිත ණය මණ්ඩල ආඥා පනතේ (311 අධිකාරය) 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ණය මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ලැබිය යුතු ගිණුම්

ණය ගෙවීම් පැහැර හැර තිබීම නිසා ණයකරුවන් තුන්දෙනෙකුගෙන් රු.195,000 ක් වූ නිවාස හා දේපළ ණය අයකර ගැනීම සඳහා 1980 හා 1983 වර්ෂවලදී නඩු පවරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා එම නඩු අවසන් වී නොතිබුණි. එසේම ණය සඳහා උකසට තැබූ දේපළ වල හිමිකම් ඔප්පු, පිඹුරුපත්, ඇපකර, ණය ලේඛන ශේෂ සනාථ කිරීම් අධිකරණ ක්‍රියාමාර්ග සඳහා අධිකරණයේ තබා ඇති බව පිළිතුරෙන් දක්වා ඇති අතර ඊට අදාළ සනාථ කිරීම් හා එම ලේඛනවල පිටපත් හෝ විගණනයට ඉදිරිපත් නොවීය. තවද ණය සඳහා ලැබිය යුතු රු.684,002 ක්වූ පොලී 2017 දෙසැම්බර් 31 දිනටත් අයවී නොතිබුණි.

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වගකීම පිළිබඳ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,650ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.18,650 ක් විය. මෙය මණ්ඩලයට අයවිය යුතු 1980 හා 1983 වර්ෂවල සිට ඉදිරියට එන රු.195,000 ක් වූ නිවාස හා දේපළ ණය ශේෂයට අදාළව වාර්ෂිකව ගලපන ලද පොලී ආදායම බව අනාවරණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

ණය මණ්ඩලය 1976 වර්ෂයේදී අහෝසි කිරීමට තීරණය කර එහි අධීක්ෂණ කටයුතු 2001 අගෝස්තු 01 දින දක්වා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට පවරා තිබුණු අතර 2001 අගෝස්තු 02 දින සිට ඈවර කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 15 කට අධික කාලයක් ඉකුත් වී තිබුණ ද ඈවර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කලයුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 31 දින දීය.